සැ. යු. -2009.04.03 දින පළ වූ අංක 1,596 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,597 - 2009 අප්‍රේල් මස 08 වැනි බදාදා - 2009.04.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 470 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 471 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 475 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 අප්‍රේල් මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 අප්‍රේල් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2009 අංක 119

DRF/21/RECT/2697.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2008 අප්‍රේල් මස 29 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (තාවකාලික මේජර්) අසෝක මල්ලවආරච්චි-ශ්‍රීලයුසේබ (නි/60604)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2008 අප්‍රේල් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් අසෝක මල්ලවආරච්චි-ශ්‍රීලයුසේබ (නි/60604)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 මැයි මස 23 වැනි දින,
කොළඹ දී ය.

04-229

---

2009 අංක 120

DIRF/RECT/234/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරීන් 2008.12.20 වැනි දින සිට පහත දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා පිළිවෙල අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබීම සහ එදින සිට ඔවුන්ගේ නම් ඉදිරියෙන් පෙන්වා ඇති රෙජිමේන්තුව/බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

සී/56820 කෙනි - බටවල පත්තිනි ගෙදර සඳුන් රංගන බටවල - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ;
සී/56817 කෙනි - බෝපැත්තේ ගෙදර සමීර ප්‍රියංකර සමරසිංහ, ගැමුණු හේවා බළකාය ;
සී/56816 කෙනි - කාලිංග සෙනවිරත්න බංඩාරනායක මුදියන්සේ රාළහාමිලාගේ ලේනාවල වලව්වේ සංජය බංඩාර ලේනාවල - ශ්‍රී ලංකා පාබල හමුදාව ;
සී/56802 කෙනි - ප්‍රසාද් මධුශාන්ත වන්නිආරච්චි - විජයබාහු පාබල රෙජිමේන්තුව ;
සී/56808 කෙනි - නිශ්ශංක මුදියන්සේලාගේ අරවින්ද බණ්ඩාර නිශ්ශංක - ගැමුණු හේවා බළකාය ;
සී/56812 කෙනි - පොඩිමරක්කල විදානෙලාගේ තරිඳු මනුරංග පෙරේරා - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
සී/56818 කෙනි - මල්ගහගමගේ ගිහාන් සනත් කුමාර - ගජබා රෙජිමේන්තුව ;
සී/56793 කෙනි - පල්ලියගුරුගේ ප්‍රණීත් මධුශංක පල්ලියගුරු - ශ්‍රී ලංකා සංඥා බලකාය ;
සී/56799 කෙනි - අමුනේ ගෙදර අමිල රුවන් - ගජබා රෙජිමේන්තුව ;
සී/56805 කෙනි - අමරසේකර කංකානම්ගේ දිදුළ රංගන අමරසේකර - ශ්‍රී ලංකා පාබල හමුදාව ;
සී/56821 කෙනි - කම්මල්පිටිය ආචාරිගේ කෞෂික ධනංජය කම්මල්පිටිය - ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය ;
සී/56813 කෙනි - දසනායක මුදියාන්සේලාගේ දිනූෂ බුද්ධික සම්පත් දසනායක - ශ්‍රී ලංකා පාබල හමුදාව ;
සී/56819 කෙනි - නානායක්කාර පතිරාජ නලීන් මධුශංඛ ධර්මසේන - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
සී/56792 කෙනි - ඇරැව්වල ලියනගේ දොන් රොෂාන් ඇරැව්වල - විජයබාහු පාබල රෙජිමේන්තුව ;
සී/56815 කෙනි - වේරගොඩ ආරච්චිල්ලාගේ ගයාන් දිලංකා වේරගොඩ - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
සී/56790 කෙනි - කරුණානායක විපුල් ප්‍රියන්ත තිලකරත්න - යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව ;
සී/56800 කෙනි - අසරප්පුලි තාරක ගනේෂ් - ශ්‍රී ලංකා පාබල හමුදාව ;
සී/56806 කෙනි - කස්තුරි ආරච්චිගේ ක්‍රිෂාන් තිවංක - ශ්‍රී ලංකා පාබල හමුදාව ;
සී/56782 කෙනි - දමින්ද බණ්ඩාර අරඹගේ - ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය ;
සී/56807 කෙනි - හේරත් මුදියන්සේලාගේ තිලින ප්‍රදීප් තරංග හේරත් - ගැමුණු හේවා බළකාය ;
සී/56807 කෙනි - දසනායක මුදියන්සේලාගේ අසේල මධුසංඛ බංඩාර- ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය ;
සී/56822 කෙනි - රත්නායක මුදියන්සේලාගේ වසන්ත කුමාර රත්නායක - ගැමුණු හේවා බළකාය ;
සී/56809 කෙනි - වීරකෝන් මුදියන්සේලාගේ බුද්ධිම වීරකෝන් - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
සී/56803 කෙනි - කදුරුපොකුණ ගමගේ බුද්ධික රුවන් පත්මසිරි - ගජබා රෙජිමේන්තුව ;
සී/56824 කෙනි - පල්ලේවත්තේ ගෙදර මහේෂ් සම්පත් කරුණාපාල - ශ්‍රී ලංකා පාබල හමුදාව ;

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී. පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 මාර්තු මස 17 වැනි දින,
කොළඹ.

04-295

# ආණ්ඩුවේ නිවේදන

## වන්දනා ගමන් ආඥාපනත

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

ආචාර්ය සරත් අමුණුගම,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2009 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග දික්වැල්ල බතීගම දීසවාලුකාරාම රජමහා විහාරයේ (වාර්ෂික පෙරහැර) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග වල -

"කඳවුරු පෙදෙස" යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ.

"දිස්ත්‍රික් ලේකම්/දිසාපති" යන්නෙන් මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුළත් වේ.

"වෛද්‍ය නිලධරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

"වන්දනාකරු" යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුළත් වී කවර හෝ කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස තුළ නතර වී සිටින යම් තැනැත්තෙක් අදහස් වේ.

"පොලිස් නිලධරයා" යන්නට කඳවුරු පෙදෙස භාර යම් ග්‍රාම සේවා නිලධරයෙක් ද ඇතුළත් වේ. තවද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස් වේ.

3. මේ නියෝග මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, දික්වැල්ල බතීගම දීසවාලුකාරාම රජමහා විහාරයේ වෙසක් මහ පෙරහැර සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාල වන්නේ ය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියකු වෙත ලිඛිතව බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

5. (1) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනාගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට බලය ඇත්තේ ය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදයේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයෙකුට දෙන ලද උපදෙස් වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතුය.

6. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතකු හෝ කඳවුරු පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතු ය.

එසේ වුව ද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා, කරත්ත ගෙනයාම හෝ ගොනුන් දක්කා ගෙන යාම හෝ සම්බන්ධයෙන් අවසර ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.

7. (1) කඳවුරු පෙදෙස ඇතුළත පහත සඳහන් ස්ථාන වෙන්කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවතා තබන ස්ථාන ;
(ආ) කරත්ත නවත්වා තැබීමේ හා ගොනුන් බැඳ තැබීමේ ස්ථාන ;
(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන ;
(ඈ) අසනීප වන වන්දනාකරුවන් සඳහා සුරැකුම් ස්ථාන ;
(ඉ) සිඟමන් යැදීමට සහ පිනට ඉල්ලා ගැනීම් කිරීම සඳහා ස්ථාන ;
(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාන ;
(උ) වෙනත් පුණ්‍ය කටයුතු සඳහා තාවකාලික මඩු ඉදි කිරීමට හැකි ස්ථාන ;
(ඌ) සේදීමේ සහ ස්නානය කිරීමේ කාර්යය සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ ස්ථාන ;
(එ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන ;
(ඒ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් පරිදි යම් ප්‍රදේශයක් වෙන් කරනු ලැබ ඇත්තේ කවර කාර්යයක් සඳහා දැයි දැක්වෙන දැන්වීමක් හෝ නාම පුවරුවක් එකී එක් එක් ස්ථානයෙහි තැබීමට කටයුතු සැලැස්විය හැකිය.

(3) (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කරනු ලැබූ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවක දී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක්ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර කඳවුරු පෙදෙස ඇතුළත වෙනක් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතු ය.

8. රෝග වලක්වාලීම සඳහා කඳවුරු පෙදෙස තුළ යම් වැවකට, ළිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම හෝ යම් වැවක්, ළිඳක්, දිය වලක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යයි දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයා හෝ වෛද්‍ය නිලධාරියා හෝ අදහස් කලහොත්, එසේ කිරීමට ඒ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට හෝ වෛද්‍ය නිලධරයාට හෝ බලය ඇත්තේ ය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක

සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට අනුකූලව මිස, යම් තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා කඳවුරුවල පෙදෙස් තුළ වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අළුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතුය.

(2) යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) වැනි ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් සාදනු ලැබීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදි කිරීමකට අළුතින් කොටසක් තැනීම හෝ එකතු කිරීම හෝ කරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාලසීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ඉදි කිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට අළුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ එම දැන්වීම භාරදෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳව සැකයක් උද්ගත වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලට අළුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කිරීමට හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළු වනු ලැබීම ද එය ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන සියළු දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

10. වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද බවට දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් පෙන්වා ඇති යම් වැසිකිලියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මළ මුත්‍රා කිරීම නොකරනු ලැබිය යුතුය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ලිඳක, දිය වළක ජලාශයක, ඇලක දොළක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතුය.

12. කැළිකසල දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ද්‍රව්‍යමය හෝ ද්‍රවමය කැළිකසල දැමීම නොකරනුන ලැබිය යුතුය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනා කරුවන්ට පිසූ ආහාර පාන බෙදා හැරීමේ විධිමත් කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාක්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතුය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා වන්දනාකරුවන්ට බෙදා දීම සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම හෝ බෙදා හැරීම හෝ නොකරනු ලැබිය යුතුය.

(3) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් විකිණීම හෝ බෙදා හැරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම යම් පොලිස් නිලධාරියෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු විසින් තහනමට ගෙන විනාශ කර දමනු ලැබීම නිත්‍යානුකූල වන්නේ ය.

15. බේකරියක්, රස කැවිලිහලක්, හෝ රස කැවිලි නිෂ්පාදනාගාරයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක හෝ කඳවුරු පෙදෙස තුළ අන් ස්ථානයක හෝ එවැනි බේකරියක්, රස කැවිලි හලක් හෝ රස කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යෑම නොකරනු ලැබිය යුතුය . සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරයාගේ හෝ වෛද්‍ය නිලධාරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකුගේ හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතු ය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියළුම බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියළු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතුය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ බෙදා හැරීම සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියළුම කේක් වර්ග රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පවත්වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතු ය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසිමේදී හෝ අන් අයුරකින් ඉවතලන ද්‍රව්‍ය හෝ කඳවුරු පෙදෙසේ කිසිම ස්ථානයක අනාවරණයව නොතිබිය යුතුය. එවැනි සියළු අපද්‍රව්‍ය ඉතුරු වූ කොටස් හෝ ඉවත ලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතුය. එවැනි සියළු අපද්‍රව්‍ය, කසල හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක හෝ ඒ අසල පොළවේ විසිකොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානය බේකරියක්, රස කැවිලි හලක්, රස කැවිලි සාදන ස්ථානයක් , භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් හෝ එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියළුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එකී අයිතිකරු

හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලපත්‍ර ලාභියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලබන්නේ ය.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියළු බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 1/2කට (ඝන අඩි 4 1 /2ට) නොඅඩු ධාරිතාවයක් ඇති දැවමය, ලෝහමය හෝ ප්ලාස්ටික් කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසළ බඳුන එහි කසල තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසළ ඉවත් කරනු ලබන විට හෝ හැර වෙනත් සෑම අවස්ථාවකදීම දැවමය, ලෝහමය, ප්ලාස්ටික් පියනකින් වසා තැබිය යුතුය.

20 (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙය නියෝගවල 16, 17, 18 හෝ 19 වැනි නියෝග කඩ කරමින් පිහිටවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූ ද, කඳවුරු පෙදෙස තුළ පිහිටියාවූ ද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට ඇත්තේ ය.

(2) යම් බේකරියක් හෝ කැවිලිහලක්, හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ හෝ ව්‍යාපාරික ස්ථානයක් බාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ යම් නීත්‍යානුකූල විධානයකට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

21. යම් අසාදන රෝගයකින් හෝ සපර්ශක රෝගයකින් පෙලෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළු නොවිය යුතුය.

22. (1) කඳවුර පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටෙක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනා කරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීම ද, ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේදී උපයෝගි කරගත යුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීමටද නීත්‍යානුකූල වන්නේ ය.

(2) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (1) ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතුය.

23. කඳවුරු පෙදෙස තුළ යම් අසාදන රෝගයක් හෝ සපර්ශක රෝගයක් වැලඳී ඇති සෑම තැනැත්තෙක්ම ද, එසේ යම් අසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැලඳී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන සෑම තැතැත්තෙක්ම ද, ඒ බව වෛද්‍ය නිලධාරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකරවයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කළ යුතුය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන හෝ පෙලෙන්නේ යයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් භෝජනාගාරයක් හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාර පාන හෝ බෙදා හැරීමේදී විකිණීමේදී හෝ නිෂ්පාදනය කිරීමේදී හෝ සහභාගි වීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතුය.

25. යම් බේකරියක, කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන් පලක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙලෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලිහලේ හෝ කැවිලි සාදන ස්ථානයේ, භෝජනාගාරයේ, දන්සැලේ, නවාතැන්පලේ හෝ වන්දනා කරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතුය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ශක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරි විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණා වහාම වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වාර්තා කළ යුතුය.

26. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම සහ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයක දී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතුය.

27. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිණිකෙළි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතුය.

28. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය හෝ යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා, වෛද්‍ය නිලධරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා, හෝ යම් පොලිස් නිලධරයෙකු විසින්,

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම සහ,

(ආ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූළ වන්නේ ය.

30. දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයා විසින්-

(අ) 6 වැනි නියෝගය හෝ 27 වැනි නියෝගය යටතේ දෙන ලද යම් අවසරයක්,

(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් සහ,

(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්

අවලංගු කිරීම යෝග්‍ය යයි හෝ මහජන යහපත පිණිස වන්නේ යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් කවර හෝ වෙලාවක එය එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බතීගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ දීසවාලුකාරාම රජමහා විහාරය පිහිටි භූමි භාගය.

ඊට මායිම් පහත දැක්වෙන පරිදි වේ :

*දකුණට :* සිරිවුල්ල පදුම මාවත,
*නැගෙනහිරට :* හින්නැවුන්නිගේ වත්ත,
*උතුරට :* බෝධිගේ වත්ත,
*බස්නාහිරට :* කෙවුල්ගාහේන සහ සිරි සංඝතිලකපුර

04-191

---

එල්. ඩී. බී. 277/40.

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

18 වන වගන්තිය යටතේ නියමය

(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 18 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංස්කෘතික කටයුතු සහ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන වන මා විසින් මේ නියමය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්මාරක ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා "ආරක්ෂක ස්මාරක" වශයෙන් සළකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරමි.

ඉහත කී ස්මාරක සම්බන්ධයෙන් වන දැන්වීම පුරාවස්තු ආඥාපනතේ 19 වන වගන්තිය ප්‍රකාරව 2008.12.19 වැනි දින අංක 1,581 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලදී.

සංස්කෘතික කටයුතු සහ ජාතික
උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2009 මාර්තු මස 12 වැනි දින
කොළඹ දී ය.

**ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන ස්මාරක උපලේඛනය**

*මධ්‍යම පළාත :*

01. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහනුවර ග්‍රාම නිලධාරී වසමට අයත්, මහනුවර නගරයේ පිහිටි පත්තිනි දේවාල ගොඩනැගිල්ල.

02. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහනුවර ග්‍රාම නිලධාරී වසමට අයත්, මහනුවර නගරයේ පිහිටි නාථ දේවාල ගොඩනැගිල්ල.

03. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහනුවර ග්‍රාම නිලධාරී වසමට අයත්, මහනුවර නගරයේ පිහිටි ශ්‍රී විෂ්ණු දේවාල ගොඩනැගිල්ල.

04. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1159 ගනේගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගනේගොඩ ශ්‍රී කතරගම දේවාල භූමිය, එහි ඇති පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු, වීථිය හා සිංහාසන මණ්ඩපය.

05. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1068 වල්ලහගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වල්ලහගොඩ ශ්‍රී කතරගම දේවාල භූමිය, එහි ඇති පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු.

06. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාවිස්ස නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පස්ගම ශ්‍රී නාථ දේවාල භූමිය, එහි ඇති පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු, වීථිය හා සිංහාසන මණ්ඩපය.

07. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලවතුගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අලවතුගොඩ සමන් දේවාල භූමිය, එහි පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු.

08. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාස්වෙල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මොරපේ ශ්‍රී කතරගම දේවාල භූමිය, එහි ඇති පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු.

*වයඹ පළාත :*

09. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1170 කිරිදිගල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කිරිදිගල්ල ඓතිහාසික ශ්‍රී විෂ්ණු දේවාල භූමිය, එහි ඇති පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු.

10. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පානවග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගොන්නව ශ්‍රී විෂ්ණු දේවාල භූමිය, එහි ඇති පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු.

11. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 571 ජංතුරේ ග්‍රාම නිලධාරී වසමට අයත් ජංතුරේ ශ්‍රී විෂ්ණු දේවාල භූමිය, එහි ඇති පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු.

12. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 822 විල්බාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි විල්බාව ශ්‍රී පත්තිනි දේවාල භූමිය, එහි ඇති පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු.

13. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 504 කැන්දවල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පල්ලේකැන්දවල ග්‍රාමයට අයත් කැන්දවල ශ්‍රී විෂ්ණු දේවාල භූමිය, එහි ඇති පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු.

*දකුණු පළාත :*

14. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 433සී, දෙවිනුවර ග්‍රාම නිලධරී වසමේ පිහිටි දෙවිනුවර උපුල්වන් දේවාල භූමිය හා සිංහාසන දේවාල භූමියෙහි ඇති පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු.

*ඌව පළාත :*

15. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටබෝව ග්‍රාම නිලධරී වසමේ පිහිටි

කොටබෝව කුඩාකතරගම දේවාල භූමිය, එහි ඇති පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු.

16. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කතරගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කතරගම රුහුණු මහා කතරගම දේවාල භූමිය, එහි ඇති පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු.

17. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බදුල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බදුල්ල නගරයේ ඇති ශ්‍රී පත්තිනි දේවාල භූමිය, එහි ඇති පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු, වීථිය හා සිංහාසන මණ්ඩපය.

04-202

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීපී/2/161/බී2/525.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2009.01.26 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කඳාන ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ආර්. එස්. කන්නන්ගර විසින් සහතික කරන ලද 2000.07.10 දින හා අංක 3884 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වත්තල, පදිංචි කරුණාමුනි රොනිතා සජීවනී ප්‍රනාන්දු හා රංජිත් ප්‍රියන්ත හිරිඹුර ගමගේ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.01.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හයලක්ෂ පනස්හතරදහස් විස්සයි ශත අනූපහ (රු. 6,54,020.95) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3884 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් තුන්සිය විසි දෙකයි ශත පනස් තුන (රු. 322.53) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු විය යුතුය).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, රාගම් පත්තු අලුත්කුරු කෝරලේ, රාගම පිහිටි කෝන්ගහවත්ත, නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. ඒ. පෙරේරා විසින් 1994.10.21 දින මැන සකසන ලද (බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් 1988.04.20 වැනි දින පිඹුරු පත් අංක 10242 හි කැබලි අංක 4 ලෙස දැක්වෙන නැවත බෙදීම හා උප බෙදීම අනුව) අංක 332 දරන පිඹුරේ කැබලි අංක ඒ වන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 8.8ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්‍රිරු අංක බී 366/248හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 මාර්තු මස 27 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

04-284

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008.11.28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් ඩී. වීරසූරිය විසින් සහතික කරන ලද 2005.04.06 දිනැති අංක 296 දරන බැඳුම්කරය මත ණය මත මුල් මුදල හා 2008.010.17 දින තෙක් පොළිය වශයෙන් රුපියල් හාරලක්ෂ අසූහතර දහස් හත්සිය අසූහතරයි ශත අනූතුනක (රු. 4,84,784.93) මුදලක් සමග රුපියල් දෙලක්ෂ අසූහය දහස් හයසිය විසිපහයි ශත අනූවක් (රු. 2,86,625.90) මත වසරකට සියයට විසිනමය (29%) බැගින් පොලියක් ද, 2009.10.18 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් රත්මලාන, කඳවල මාවත, අංක 59/4හි පදිංචි ලියනගම කංකානම්ගේ ගාමිණී මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 296 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී ඉහත 1හි සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, කොළොන්නාව, විහාර මාවත, අංක 50/3හි පදිංචි වෙන්දේසිකාර ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් මහතුන් හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ, රත්මලානෙහි පිහිටි කඳවල පාරේ, වරිපනම් අංක 59/4 දරන "කඳවල එස්ටේට්" නමැති ඉඩමෙහි එයට අයත් ගහකොළ, වැවිලි සහ සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ආර්. එස්. පෙරේරා විසින් සාදන ලද 1969 මාර්තු මස 10 දිනැති අංක 11A/1969 දරන පිඹුරෙහි (බලයලත් මිනින්දෝරු කේ. ආර්. ඩී. අබේගුණවර්ධන විසින් සාදන ලද 1981.03.06 දිනැති උපුටා ගත් පිඹුර) ලොට් "එච්" ලෙස දක්වා විස්තර කර නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් H උතුරට : K, J. සහ I ද, නැගෙනහිරට : අඩි 10ක් පළල ලොට් පාර ද, (19B සහ 20A කට්ටිය) දකුණට : ලොට් G සහ F ද, බස්නාහිරට : ලොට් Q ද මායිම්ව එකී අංක 11ඒ/1969 පිඹුර ප්‍රකාර පර්චස් හතයි දශම දෙකක (අ. 0, රූ. 0, පර්. 7.2) වපසරියකින් යුක්ත වන අතර, මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1308/96හි ලියාපදිංචි කර ඇත.

එම්. ටී. කරුණාරත්න මහත්මිය,
කළමනාකරු.

ලංකා බැංකුව,
රත්මලාන.

04-298

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008 නොවැම්බර් මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් කේ. තිරුවරුල්වල්ලල් විසින් සහතික කරන ලද 1980.03.28 දිනැති අංක 58 දරන උකස් බැඳුම්රය, මහජන නොතාරිස් කේ. නරේන්ද්‍රකුමාර් විසින් සහතික කරන ලද 1981.07.20 දිනැති අංක 195 දරන උකස් බැඳුම්කරය, මහජන නොතාරිස් කේ. නරේන්ද්‍රකුමාර් විසින් සහතික කරන ලද 1982.09.22 දිනැති අංක 275 දරන උකස් බැඳුම්කරය, මහජන නොතාරිස්, එම් එන්. ජයවර්ධන විසින් සහතික කරන ලද 1985.12.11 දිනැති අංක 578 දරන උකස් බැඳුම්කරය, මහජන නොතාරිස් එම්. එන්. ජයවර්ධන විසින් සහතික කරන ලද 1988.09.01 දිනැති අංක 829 දරන උකස් බැඳුම්කරය , මහජන නොතාරිස් සී. කේ. එස්. අයි. පී. ඒ. මුදලිගේ විසින් සහතික කරන ලද 1991.06.19 දිනැති අංක 532 දරන උකස් බැඳුම්රය, මහජන නොතාරිස් එම්. ඩී. පී. එස්. කරුණානායක විසින් සහතික කරන ලද 1995.07.26 දිනැති අංක 61 දරන උකස් බැඳුම්කරය, මහජන නොතාරිස් සී. කේ. එස්. අයි. පී. ඒ. මුදලිගේ විසින් සහතිත කරන ලද 1997.09.03 දිනැති අංක 729 දරන උකස් බැඳුම්කරය සහ මහජන නොතාරිස් කේ. කේ. පී. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද 2000.12.22 දිනැති අංක 327 දරන උකස් බැඳුම්කරය යන බැඳුම්කර මත මුල් මුදල හා 2008.10.31 දින තෙක් අයිරාව මත හිඟහිටි පොලිය වශයෙන් රුපියල් අටකෝටි අනූහතර ලක්ෂ හැටඅට දහස් තුන්සිය හැටහතයි ශත දොළහක (රු. 8,94,68,367.12) මුදලක් සමග රුපියල් හයකෝටියක (රු. 6,00,00,000) ක මුදලක් මත වසරකට සියයට විසිදෙකයි දශම තුනයි අට (22.38%) බැගින් වැඩිපුර පොළියක් ද, 2008.11.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කොළඹ 02, වොක්ෂොල් වීදිය, අංක 137හි පිහිටි සීමාසහිත සමර්විල් සහ සමාගමෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක දරන බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් අටකෝටි අනූහතර ලක්ෂ හැටඅට දහස් තුන්සිය හැටහතයි ශත දොළහක (රු. 8,94,68,367.12) මුදල සමග රුපියල් හයකෝටියක (රු. 6,00,00,000) මුදලක් 2008.11.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් හි පදිංචි ප්‍රසිද්ධ පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවන් වන, ආර්. එස්. එම්. වෙන්දේසිකාර මහතුන් හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, සම්බන්ධතා කළමනාකරු (අයකර ගැනීම් - ආයතනික) ට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා සීමාව තුළ, කොම්පඤ්ඤවීදියේ, වොක්ෂෝල් වීදියේ පිහිටි, වොක්ෂෝල් වීදියෙහි, වරිපනම් අංක 137 දරන නෝව්ච් ස්ටෝර්ස් නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු ජේ. ඊ. වෝකර් විසින් සාදන ලද 1960 ජුනි මස 20 වැනි දිනැති අංක 259 දරන පිඹුරෙහි විස්තර කොට දක්වා ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : පාරට වෙන් කළ කොටස ද, නැගෙනහිරට : වොක්ෂෝල් වීදියේ වරිපනම් අංක 141 දරන පරිශ්‍රය ද, දකුණට : වොක්ෂෝල් වීදිය සහ වොක්ෂෝල් වීදියේ වරිපනම් අංක 131 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : වොක්ෂෝල් පටුමගෙහි වරිපනම් අංක 55/57 සහ 58 දරන පරිශ්‍රය ද, මායිම්ව රූඩ් එකයි පර්චස් තිස් දෙකයි දශම අටයි අටක (අ. 0, රූ. 1, පර්. 32.88) බිම් ප්‍රමාණයෙන් යුක්ත වන අතර, මෙය කොළඹ දිස්ත්‍රික්කයේ, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "ඒ " කොටසේ 939 වැනි වෙළුමෙහි 119 වැනි පත්‍රිරුවෙහි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

ඉහත කී කොම්පඤ්ඤ වීදියේ, වොක්ෂෝල් පටුමගේ, පිහිටි බලයලත් මිනින්දෝරු එම්. අයි. සමීර් විසින් සාදන ලද 1957 නොවැම්බර් මස 27 සහ 28 දිනැති අංක 69 දරන පිඹුරෙහි ලොට් 7 (වෙන්කළ පාර) ලෙස දක්වා විස්තර කර ඇති බිම් කැබැල්ල එනම්, එකී ලොට් 7, උතුරට : ලොට් 1, 2, 3A, 3B හා 4 ද, නැගෙනහිරට : වොක්ෂෝල් වීදියේ වරිපනම් අංක 141 දරන පරිශ්‍රය ද, ලොට් 6 සහ 2 ද, දකුණට : ලොට් 5A, 5B, 5C 5D, 5E සහ 6 ද, බස්නාහිරට : වොක්ෂෝල් පටුමග සහ ලොට් 1 සහ 6 ද මායිම්ව ඉහත කී අංක 69 දරන පිඹුර ප්‍රකාර රූඩ් තුනයි පර්චස් 11 (අ. 0, රූ. 3, පර්. 11)ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A කොටසේ, 904 වැනි වෙළුමෙහි 241 වැනි පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. සිවරාජා,
සම්බන්ධතා කළමනාකරු.

2008 නොවැම්බර් මස 09 වැනි දින,
ලංකා බැංකුව,
අයකර ගැනීමේ ආයතනික ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

04-297

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - දෙමටගොඩ ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.02.26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2005.12.16 දින සහ අංක 1471 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2008.05.28 දින අංක 2141 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විජේසිංහ පතිනිගේ දිනේෂ් පෙරේරා විජේසිංහ (තනි අයිතිකරු-ලැනික් ස්පෝට්ස්) යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් දාහත් මිලියන එක්ලක්ෂ හතලිස් හත්දහස් දෙසීය හැත්තෑපහ (රු. 1,71,47,275) ක මුදලක් 2008.11.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී 1,71,47,275ක මුදලට 2008.12.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1471 සහ 2141 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (නමුත් කොළඹ කොට්ඨාසය තුළ ලියාපදිංචි කර ඇති) සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවේ කැළණිය ඒකකය තුළ වනවාසල ගමෙහි පිහිටි වනවාසල පාරේ, වරිපනම් අංක 107 සහ 109 දරන "කෝන්ගහවත්ත සහ මුල්ලේකුඹුරපිල්ලෑව" නමැති ඉඩමට බලයලත් මානක ආර්. කරුණාසේකර විසින් මැන සාදන ලද 2005.06.23 දිනැති අංක 4745 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද "ලොට් 1" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : නාගසේස විද්‍යාලයට අයත් සහ සී. රත්නායකට සහ අනෙක් අයතට අයත් දේපළ වලින් සහ විවිධ සේවා සමුපකාර සමිති පරිශ්‍රයෙන් ද, නැගෙනහිරට : එස්. ජයවීරට, සී. රත්නායකට සහ අනෙක් අයට අයත් දේපළ වලින් ද, සහ වනවාසල පාරෙන් ද, දකුණට : ටී. ඩී. ලැනී නෝනා හිමිකම් කියන වනවාසල පාරේ, වරිපනම් අංක 105/14 දරන සහ ජී. ඩී. ආනන්ද හිමිකම් කියන වනවාසල පාරේ, වරිපනම් අංක 105/10 දරන පාරෙන්ද (පුද්ගලික) සහ බස්නාහිරට : ටී. ඩී. ලැනී නෝනා හිමිකම් කියන වනවාසල පාරේ, වරිපනම් අංක 105/14 දරන පරිශ්‍රයෙන් සහ මුල්ලෙකුඹුරෙන් ද මායිම් වූ එකී අංක 4745 දරන පිඹුර ප්‍රකාරව රූඩ් දෙකයි පර්චස් විසිදෙකයි දශම දෙකක (අ. 0, රූ. 2, පර්. 22.2) විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියළුම දේත් සමග වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 684/46 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

04-301/4

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කුරුණෑගල ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008 සැප්තැම්බර් මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2005.06.29 දින සහ අංක 1082 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලේකම්වසම් උරාල ලියනගේ ක්‍රිෂාන්ත ප්‍රියදර්ශන කුමාර ලියනගේ ණයකරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ (පහත විස්තර කරන ලද පළමුවැනි උපලේඛනය පරිදි) රුපියල් හයලක්ෂ හතලිස්පන්දහස් තුන්සිය අනූඅටයි ශත තිස්පහ (රු. 6,45,398.35) ක මුදලක් 2007.12.31 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වදුරාගල විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2006.07.24 දින සහ අංක 13396 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලේකම්වසම් උරාල ලියනගේ ක්‍රිෂාන්ත ප්‍රියදර්ශන කුමාර ලියනගේ ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ (පහත විස්තර කරන ලද පළමුවන සහ දෙවන උපලේඛනයේ පරිදි) (රුපියල් දහඅටලක්ෂ තුන්දහස් එකසිය පනස්හතයි ශත අසූහත (රු. 18,03,157.87)ක මුදලක් 2007.12.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වදුරාගල විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2006.08.15 දින සහ අංක 13452 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලේකම්වසම් උරාල ලියනගේ ක්‍රිෂාන්ත ප්‍රියදර්ශන කුමාර ලියනගේ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ පහත විස්තර කරන ලද තුන්වන උපලේඛනයේ පරිදි රුපියල් හාරලක්ෂ හැටඑක්දහස් හාරසිය හැත්තෑහයයි ශත හැත්තෑව (රු. 4,61,476.70) ක මුදලක් 2007.12.31 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

රු. 29,10,032.92ක මුදලට 2008.01.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද

වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්නතරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1082, 13396 සහ 13452 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාර අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### පළමුවැනි උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තුවේ, ඉහලවිසිදෙකේ කෝරළේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ බොලගම ගමෙහි පිහිටි "යකල්ල එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මානක පී. බී. දිසානායක විසින් මැන සාදන ලද අංක 3690 සහ 2003 නොවැම්බර් මස 20 වැනි දින සහ 2004 මාර්තු මස 15 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 1" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ඒ. අබ්දුල් හමීඩ්ට අයත් ඉඩමෙන් ද, එච්. පී. බන්දුසේනට අයත් ඉඩමෙන් ද, එල්. එච්. බන්දුවතීට අයත් ඉඩමෙන් ද, විජේසූරියට අයත් ඉඩමෙන් ද, ඩබ්. එම්. හේවාවසම්ට අයත් ඉඩමෙන් ද සහ එන්. එස්. එම්. එන්. එස්. මොහොමඩ් නවාස්ට අයත් ඉඩමෙන් ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරට අයත් ලොට් 6න් ද සහ ලොට් 5 ලෙස දැක්වෙන අඩි 15ක් පළලැති පාරෙන් ද, දකුණට : පිඹුරු අංක 3690ට අයත් ලොට් 13න් ද අඩි 22ක් පළලැති පාරෙන් ද සහ බස්නාහිරට : දඹුල්ල සිට කුම්බලන්ග දක්වා දිවෙන ප්‍රාදේශීය සභා පාරෙන්ද මායිම් වූ අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් පහලොවයි දශම පහ (අ. 1, රූ. 2, පර්. 15.5) ක විශාල ඉඩමට අයත් ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 883/203හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තුවේ, ඉහලවිසිදෙකේ කෝරළේ, පරණගම්පිටිය ගමෙහි පිහිටි "පරණගම්පිටිය" එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක එම්. ඩබ්. ආරියරත්න විසින් මැන සාදන ලද අංක 123/2004බී සහ 2004 මාර්තු මස පිඹුර ප්‍රකාර බෙදා, වෙන් කරන ලද ලොට් "193" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ඉහත සඳහන් පිඹුරේ "ලොට් 192" න් ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරේ ලොට් 194න් ද, දකුණට : ලොට් 13න් ද (අඩි 20ක් පළලැති පාර) සහ බස්නාහිරට : කාණුවකින්ද මායිම් වූ පර්චස් පහලව (අ. 0, රූ. 0, පර්. 15) ක විශාල ඉඩමට අයත් ගොඩනැගිලි, වැවිලි සහ අනෙකුත් සියළුම දේත් සමග වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 876/277 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තුවේ, ඉහලවිසිදෙකේ කෝරළේ, පරණගම්පිටිය ගමෙහි පිහිටි පරණගම්පිටිය එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක එම්. ඩබ්. ආරියරත්න විසින් මැන සාදන ලද අංක 123/2004බී සහ 2004 මාර්තු මස පිඹුර ප්‍රකාර බෙද වෙන් කරන ලද ලොට් 192 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 63න් ද (අඩි 30ක් පළලැති පාර) නැගෙනහිරට : ඉහත කී පිඹුරේ ලොට් 195න් ද, දකුණට : ඉහත කී පිඹුරේ ලොට් 193න් ද, සහ බස්නාහිරට : කාණුවකින්ද මායිම් වූ පර්චස් පහලව (අ. 0, රූ. 0, පර්. 15)ක විශාල ඉඩමට අයත් ගොඩනැගිලි, වැවිලි සහ අනෙකුත් සියළුම දේත් සමග වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී876/276 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

### තුන්වන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තුවේ, ඉහලවිසිදෙකේ කෝරළේ, බොලගම ගමෙහි පිහිටි "වගුරුවෙල වත්ත" නමැති ඉඩමට බලයලත් මානක එස්. ජේ. ඩී. අයි. සිරිවර්ධන විසින් මැන සාදන ලද අංක 98/61 සහ 1998 මාර්තු මස 06 වැනි දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 01" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : බලයලත් මානක ජී. එස්. ගොරොක්ගහගොඩ විසින් මැන සාදන ලද පිඹුරු අංක 339ට අයත් ලොට් 2න් ද, නැගෙනහිරට : කුම්බලන්ග සිට බක්මීගොල්ල දක්වා දිවෙන ප්‍රසිද්ධ පාරෙන් ද, දකුණට : ඉඩම දක්වා දිවෙන පාරකින් ද සහ එම්. ඩබ්. කළුබණ්ඩාට අයත් ඉඩමෙන් ද, දකුණු-බස්නාහිරට : ඉඩම දක්වා දිවෙන පාරකින් ද සහ එම්. ඩබ්. කළුබණ්ඩාට අයත් ඉඩමෙන් ද, මායිම් වූ රූඩ් එකයි පර්චස් දහය (අ. 0, රූ. 1, පර්. 10) ක් විශාල ඉහත සඳහන් පිඹුරට අයත් ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

04-301/1

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කොටහේන ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009 ජනවාරි මස 22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ඹෑව විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2007.09.28 දින සහ අංක 2187 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රන්දෙනිය ආරච්චිගේ ප්‍රමිල් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස් අටලක්ෂ හතලිස් නවදහස් නවසිය අසූහතරයි ශත හතලිස්දෙක (රු. 48,49,984.42) ක මුදලක් 2008.10.15 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී 48,49,984.42ක මුදලට 2008.10.16 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2187 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ කොටහේන වසම තුළ කොටහේන පිහිටි ගල්පොත්ත වීදිය තුළ

පිහිටි ගල්පොත්ත වීදියේ, වරිපනම් අංක 60 දරන ඉඩමට බලයලත් මානක එස්. රාසප්පා විසින් මැන සාදන ලද 1988.04.16 දිනැති අංක 1072 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් “ඒ ” ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ගල්පොත්ත වීදියෙන් ද, නැගෙනහිරට : ගල්පොත්ත වීදියේ, වරිපනම් අංක 62 දරන පරිශ්‍රයෙන් ද, දකුණට : වරිපනම් අංක 36 සහ 40 (පැරණි අංකය) දරන ඉඩම්වලින් ද සහ බස්නාහිරට : ගල්පොත්ත වීදියේ, වරිපනම් අංක 56 දරන පරිශ්‍රයෙන් ද, මායිම් වූ එකී අංක 1072 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 5.75) ක් විශාල ඉඩම සහ ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලුම දේත් සමග වන අතර, මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 778/281 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම නැවත මැනීමකින් පසුව මෙසේ විස්තර වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාවේ වසම් අංක 7 තුළ නැගෙනහිර කොටහේනෙහි පිහිටි ගල්පොත්ත වීදියේ, වරිපනම් අංක 60 දරන ඉඩමට බලයලත් මානක එම්. ඩබ්. ඩී. එස්. ද සිල්වා විසින් මැන සාදන ලද 2006.11.17 දිනැති අංක 4050 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලොට් “ඒ1” ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ගල්පොත්ත වීදියෙන් ද, නැගෙනහිරට : ගල්පොත්ත වීදියේ වරිපනම් අංක 62 දරන පරිශ්‍රයෙන් ද, දකුණට : ගල්පොත්ත වීදියේ, වරිපනම් අංක 36 දරන පරිශ්‍රයෙන් ද, සහ බස්නාහිරට : ගල්පොත්ත වීදියේ, වරිපනම් අංක 56 දරන පරිශ්‍රයෙන් මායිම් වූ එකී අංක 4050 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හයයි දශම එකයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 6.10) ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියළුම දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි (නීති),
මාණ්ඩලික ලේකම්.

04-301/2

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - ප්‍රධාන ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2004ක් වූ ඔක්තෝබර් මස 07 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් සහතික කරන ලද්දාවූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද, 1999.07.29 දින සහ අංක 145 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අසුරුමුනි සුනිල් ශාන්ත සිල්වා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස්අටදහස් අටසිය හැත්තෑහතරයි ශත අනූතුන (රු. 2,38,874.93) ක මුදලක් 2004.02.28 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී 2,38,874.93ක මුදලට 2004.03.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 145 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාර පී. කේ ඊ. සේනාපති මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ පාලිගෙදර පිහිටි ගල්පොත්තවත්ත නමැති ඉඩමට බලයලත් මානක එච්. එල්. ගුණසේකර විසින් මැන සාදන ලද 1982 අප්‍රේල් මස 09 වැනි දින දරන අංක 334 දරන පිඹුරේ දක්වා ඇති ලොට් අංක 1 ලෙස ලකුණු කර ඇති ඉඩමට, උතුරට : පාරෙන් ද, නැගෙනහිරට : ලොට් අංක 2න් ද, දකුණට : සෙලෝ හාමිගේ ඉඩමෙන් ද, බස්නාහිරට : මිහිර මාවතෙන් ද මායිම් වූ පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක් විශාල ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වන අතර, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2415/18හි ලියාපදිංචි වී ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

04-301/3

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බොරැල්ල ශාඛාව
## (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.02.26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. සමරනායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද, 2007.04.05 දින සහ අංක 1572 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිනත්තොම්මෙලාගේ ධම්මික ප්‍රභාත් සිල්වා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්ලක්ෂ පනස් පන්දහස් පන්සිය දොළහයි ශත තිස්තුන (රු. 30,55,512.33) ක මුදලක් 2008.12.15 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී 30,55,512.33ක මුදලට 2008.12.16 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද

තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1572 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ (කැස්බෑව උපකාර්යාලය) කැස්බෑවෙහි පිහිටි "කොස්ගහකනත්ත" නමැති ඉඩමට බලයලත් මානක කේ. එම්. ඒ. එච්. බණ්ඩාර විසින් මැන සාදන ලද 2003.05.30 දිනැති අංක 1269 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් "14" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 15න් ද, නැගෙනහිරට : බලයලත් මානක ලූකස් එච්. ද මෙල් විසින් මැන සාදන ලද 1926.04.20 දිනැති අංක 634 දරන පිඹුරේ ලොට් ඩී වලින් ද, දකුණට : ලොට් 12න් ද සහ බස්නාහිරට : ලොට් 13න් ද (අඩි 15ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද) මායිම් වූ එකී අංක 1269 දරන පිඹුර ප්‍රකාරව පර්චස් නවයයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 9.5)ක් විශාල ඉඩම වේ.

එකී අංක 1572 දරන උකස් බැඳුම්කරයෙහි උපලේඛනයේ වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතීන්ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි (නීති),
මාණ්ඩලික ලේකම්.

04-301/5

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - හල්ස්ඩ්‍රොප් ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.02.26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2003.10.02 දින සහ අංක 871 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලාල් දයා සෙනෙවිරත්න යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දාහත් ලක්ෂ අසූහත්දහස් තිස්හයයි ශත හය (රු. 17,87,036.06) ක මුදලක් 2008.10.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 17,87,036.06ක මුදලට 2008.11.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 871 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල නගර සභා සීමාව තුළ ඉදිවිටියෙහි පිහිටි රණසිංහ පාරේ, වරිපනම් අංක 29 දරන "ඕවෙල ඔවිට" නමැති ඉඩමට බලයලත් මානක එම්. ඩී. එඩ්වඩ් විසින් මැන සාදන ලද 1997.02.05 දිනැති අංක 1339 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වන උතුරට : රණසිංහ පාරෙන් ද, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : එම ඉඩමේම ඉතිරි කොටසින් ද සහ බස්නාහිරට : එම්. එල්. ෆොන්සේකාට අයත් පාළු වූ කුඹුරෙන් ද මායිම් වූ එකී අංක 1339 දරන පිඹුර ප්‍රකාර රූඩ් එක (අ. 0, රූ. 1, පර්. 0)ක් විශාල ඉඩම සමග ඇති සියලුම දේත් වන අතර, මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 52/194 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

04-301/6

---

### මහජන බැංකුව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ (29 ඩී) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.05.30 දින දී පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

නුවරඑළිය, ප්‍රසිද්ධ නොතාරිස් ජයමිණී අඹගහවත්ත විසින් මහජන බැංකුව නමට ලියා සහතික කරන ලද අංක 134 හා 2003 නොවැම්බර් 12 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ලලිත් සමරසිංහ දිසානායක සහ චන්ද්‍රා සමරසිංහ දිසානායක හා ජයසිංහ මුදියන්සේලාගේ ඥානවතී සහ අතුල සමරසිංහ දිසානායක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස් බැඳුම්කරය යටතේ දැනට රුපියල් පන්ලක්ෂ හතලිස් නව දහස් එකසිය අටකුත් ශත විසි අටක (රු.5,49,108.28) මුදලක් මහජන බැංකුවට ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පන්ලක්ෂ හතලිස් නව දහස් එකසිය අටකුත් ශත විසි අටක (රු.5,49,108.28) මුදල සහ 2007.11.23 වන දින සිට විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට විසිහතරකුත් දශම පහ (24.5%) බැගින් පොලිය ද ඉහත කී මහජන බැංකු පනතේ 29 ඔ (29L) වගන්තිය යටතේ අයකරගත හැකි වියදම් හා ගාස්තු ද අනතුරුව යම් මුදලක් ලැබී ඇත්නම් එම මුදල

අඩුකොට අයකර ගැනීම සඳහා, ඉහත සඳහන් අංක 134 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුව වෙත උකස් කර තිබෙන දේපළ සහ පරිශ්‍රය කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 දරන ස්ථානයේ, බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1986 අංක 32 දරන මහජන බැංකු (සංශෝධන) පනතින් සංශෝධිත, මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ විස්තරය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය කොට්ඨාසයේ, දිඹුල කෝරලේ, තලවකැලේ ලිඳුල නගර සභා බල ප්‍රදේශයට දැනට අයත්, කළින් බෙයාර්වෙල් ගෲප් වතුයායේ, බෙල්ග්‍රේව් වත්තේ කොටසක් වූ, (බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 213 හා 1960 ජුනි 20 දින දරන පිඹුරේ ලොට් අංක 1 සහ 2 ඒකාබද්ධ කළ ඉඩමේ අතුරු බෙදීමක් වන) බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 467 හා 1962 ජූලි 15 දින දරන පිඹුරේ ලොට් අංක 11 දරන බිම් කට්ටිය වන, උතුරට : ලොට් අංක 10 නැගෙනහිරට : බෙල්ග්‍රේව් එස්ටේට් වත්ත ද දකුණට : ලොට් අංක 12 ද බස්නාහිරට : මහ පාරද යන මායිම් ඇතුළත පර්චස් පහකුත් දශම බිංදුවයි අටක් (අ. 0, රූ 0, පර්. 5.08) විශාලත්වය ඇති, ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. රාමරාජා ලියා සහතික කළ අංක 1067 හා 2000.05.24 දින දරන තෑගි ඔප්පුව පිට අයිතිව බුක්ති විඳින, ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ද වේ. මෙම ඉඩම නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 14/17 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 40, උද්‍යාන පාර,
නුවරඑළිය.

04-263

---

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ විස්තරය

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 08 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.02.24 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ආර්. රණසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 3393 සහ 2003 ජූලි මස 15 දිනැති උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය සියඹලාපේ මීගහවත්ත අංක 65 දරන ස්ථානයේ මායාදුන්න ට්‍රේඩර්ස් යන නාමය, විලාසය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන මායාදුන්න අප්පුහාමිලාගේ ලාල් අබේවික්‍රම, කන්දෙමුල්ල ආරච්චිගේ ඉන්ද්‍රානි මායාදුන්න සහ පැලවත්ත විතානගේ අමිල සම්පත් පෙරේරා (මෙහි බද්ධ ණය ගැනුම්කරුවන් වන) යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී මායාදුන්න අප්පුහාමිලාගේ ලාල් අබේවික්‍රම සහ කන්දෙමුල්ල ආරච්චිගේ ඉන්ද්‍රානි මායාදුන්න (මෙහි බද්ධ උකස්කරුවන් වන) යන අය විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද, තවද ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී බද්ධ ණය ගැනුම්කරුවන් විසින් පැහැර හැරීම සිදු කරන ලද බැවින් ද,

රුපියල් විසිනවලක්ෂ පනස්එක්දහස් හාරසිය තිස්දෙකකුත් ශත දහතුනක (රු. 29,51,432.13) මුදල සහ 2009.01.19 වැනි දිනට අයිරා පහසුකම් මත හිඟ මුල් මුදල වන ඉහත කී මුදල මත 2009.01.20 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් එකඟ වූ පරිදි මාසික විරාමයන් සමග තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද සිට ගෙවී ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ට්‍රියඩ් ඔක්ෂනියර්ස් හි එන්. ඩී. ඩී. පී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ (දෙල්ගොඩ උප කාර්යාලය) මීගහවත්ත ගමේ පිහිටි "මීගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ලෙස්ලි එන්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 1539 සහ 2003 මැයි මස 16 වැනි දිනැති පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් ඒ දරන බිම් කොටසට මායිම්, ඊසානට : ජී. ඒ. සිරිසේනගේ කුඹුර ද, ගිණිකොණට : ඩබ්ලිව්. ඒ. ඇල්බට්ගේ ඉඩම සහ අංක 11/97 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද එම ඉඩමේම කොටසක් ද, නිරිතට : දේවාල පාරේ සිට නිවසට වැටී ඇති පාර ද, වයඹට : දේවාල පාර ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1539 දරන පිඹුර අනුව රූඩ් දෙකකුත් පර්චස් විසිහතයි දශම හතරයි නවයක (අ. 0, රූ. 2, පර්. 27.49) විශාලත්වයෙන් යුක්ත බිම් කැබැල්ල ය. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 652/08 දරන හිමිකම් වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත සඳහන් පරිදි මීගහවත්ත ගමේ පිහිටි "මීගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද අංක 480 සහ 1999 ජූලි මස 27 වැනි දිනැති පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 1 දරන බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 17 ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : උඩුපිල සිට මහනුවර දක්වා වැටී ඇති පාර ද, බස්නාහිරට : දේවාල පාර ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 480 දරන පිඹුර අනුව පර්චස් දහසයකුත් දශම එකයි බින්දුවක (අ. 0, රූ. 0, පර්. 16.10) විශාලත්වයෙන් යුක්ත බිම් කැබැල්ල ය. මෙය ගම්පහ ඉඩම්

ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 529/209 දරන හිමිකම් වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගමේ ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

04-304/1

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 පෙබරවාරි මස 24 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ආර්. රණසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 3321 සහ 2003 ජූනි මස 11 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ 05, ස්කෙල්ටන් පාරේ ඇතුළු ඩික්මන්ඩ්ස් පාරේ අංක 5A දරන ස්ථානයේ පදිංචි (අංක 542621559V දරන ජාතික හැඳුනුම්පත්හිමි) නෙල්ලෙයිනායගම් එසකියප්පන් තායුමාන සුන්දරම් යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් ඔහු විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින්ද ;

තවද ඉහත කී නෙල්ලෙයිනායගම් එසකියප්පන් තායුමාන සුන්දරම් ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදුකරනු ලැබ ඇති බැවින් ද,

රුපියල් අනූලක්ෂ විසිදහස් පන්සියතිස්අටකුත් ශත විසිහයක මුදල (රුපියල් 90,20,538.26) සහ 2000.02.15 වන දිනට නිවාස ණය මත හිඟ මුල් මුදල වන රුපියල් හැත්තෑපන්ලක්ෂ හත්දහස් හාරසිය හතළිස්හයකුත් ශත විසිපහක මුදල (රුපියල් 75,07,446.25) මත 2009.02.16 වන දින සිට විකිණීමේ දිනය තෙක් එකඟ වූ පරිදි තවදුරටත් පොලිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන්ද දින සිට ගෙවා ඇති (යම් මුදලක් වේතොත්) එම මුදල අඩු කොට අයකරගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඕක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලයේ පල්ලේ පත්තුවේ කොළඹ මහ නගර සභාවේ අංක 38 දරන නාගරික කොට්ඨාසයේ බම්බලපිටිය රජින පාරේ පිහිටි කොළඹ 03 රජින පාරේ වරිපනම් අංක 22 1/4 දරන බලයලත් මිනින්දෝරු එම්. එස්. ටී. පී. සේනාධීර, එෆ්. එස්. අයි. එෆ්. අයි. වී. ටී. විසින් මැන සාදන ලද අංක 1934 සහ 1996 මාර්තු මස 22 දිනැති සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත ක්වීන්ස් කෝට් සහාධිපත්‍ය ගොඩනැගිල්ලට පළමු වන මහලේ පිහිටි ඒකක 6 ලොට් 6 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කළ නේවාසික කොටස් නිවාසයට මායිම් උතුරට මෙම කොටසේ උතුරු බිත්තියේ මධ්‍යය සහ මෙම ඒකක සහ ඒකක 7 ලොට් 7 වෙන් කරන මෙම කොටසේ උතුරු බිත්තියේ මධ්‍යය සහ DIR වශයෙන් ලකුණු කළ නලය ද, නැගෙනහිරට : මෙම ඒකකය සහ ඒකක 7 ලොට් 7 වෙන් කරන මෙම කොටසේ නැගෙනහිර බිත්තියේ මධ්‍යය සහ DIL සහ DIR වශයෙන් ලකුණු කළ නළය ද, දකුණට : මෙම ඒකකය සහ ZI වශයෙන් ලකුණු කළ කොරිඩෝව වෙන් කරන මෙම ඒකකයේ දකුණු බිත්තියේ මධ්‍යය ද XI වශයෙන් ලකුණු කළ තරප්පුපෙළ, B 1 වශයෙන් ලකුණු කළ සෝපානය DIR සහ DIK වශයෙන් ලකුණු කළ නළ ද, බස්නාහිරට : මෙම කොටසේ බස්නාහිරට බිත්තියේ මධ්‍යය සහ මෙම කොටස සහ BI වශයෙන් ලකුණු කළ සෝපානය වෙන් කරන මෙම කොටසේ බටහිර බිත්තියේ මධ්‍යය ද, DIR වශයෙන් ලකුණු කළ නළය ද ඉහළට ඒකක 12 ලොට් 12 හි ගෙබිමේ මධ්‍යය ද පහළට මෙම කොටසේ ගෙබිමේ මධ්‍යයද යන මායිම් තුළ පිහිටි වර්ග අඩි 2057.71 ක විශාලත්වයෙන් යුක්ත ගෙබිම සහ ඊට විසිත්ත සහ කෑම කාමරයක්, පැන්ට්‍රියක්, නිදන කාමර තුනක් වැසිකිළි දෙකක්, සේවක කාමරයක් සහ වැසිකිළියක් බැල්කනියක්ද ඇතුළත් වන අතර ඒකක 6 ලොට් 6 සඳහා පොදු පහසුකම්වල සමානුපාතික කොටස් අගය 1.69%කි. මෙම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ConA. 52/51 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඒකක 6 ලොට් 6, බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු එම්. එස්. ටී. පී. සේනාධීර විසින් මැන සාදන ලද අංක 1934 සහ 1996 මාර්තු මස 22 දිනැති පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් D හි පිහිටි සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය ඒකකයක් වන අතර එම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Con. A. 47/75 යටතේ ලියාපදිංචි කර ඇත.

තවද ඊට අංක 3321 දරන ඔප්පුවේ දෙවැනි උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇති ව්‍යවස්ථාපිත පොදු පහසුකම් ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

04-304/2

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක

PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 පෙබරවාරි මස 11 වන දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. පී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු "බැඳුම්කරය" වශයෙන් හඳුන්වනු ලබන) අංක 428 සහ 2006 ජනවාරි මස 30 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු "උකස්කරු" වශයෙන් සඳහන් කරනු ලබන) ගොතටුව නව නගරයේ වැලිකඩ පාරේ අංක 838/A දරන ස්ථානයේ පදිංචි වීරසිංහ මුදියන්සේලාගේ ප්‍රියන්ජල ගංගානාත් වීරසිංහ යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් (කලින් කොළඹ 01, යෝර්ක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින්ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2008.12.09 වන දිනට රුපියල් දසලක්ෂ හැටතුන්දහස් නවසියදහතුනකුත් ශත හැත්තෑපහක මුදලක් (රුපියල් 1,063,913.75) වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින්ද,

ඉහත කී රුපියල් දසලක්ෂ හැටතුන්දහස් නවසියදහතුනකුත් ශත හැත්තෑපහක මුදල (රුපියල් 1,063,913.75) සහ 2008.12.09 දිනට නිවාස ණය මත හිඟ මුල් මුදල වශයෙන් රුපියල් නවලක්ෂ අසූඅටදහස් දෙසියපහළොවකුත් ශත පනස්හයක මුදල (රුපියල් 988,215.56) මත 2008.12.10 වන දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 29.00% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම් ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඕක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරනලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලයේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ හේවාගම පිහිටි වැලිවිටවත්ත සහ උඩුවිලකුඹුර නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් ම ැන සාදන ලද අංක 2395 සහ 2003 අප්‍රේල් මස 20 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ ලොට් 64 දරන බිම් කොටසට මායිම් උතුරටඃ ලොට් 65 ද, නැගෙනිරට : ලොට් 94 ද, දකුණට : ලොට් 63 ද බස්නාහිරට : ලොට් 69 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2395 දරන පිඹුර අනුව පර්චස් අටයි දශම බින්දුවයි තුනක (අ. 0, රූ. 0, ප. 8.03) විශාලත්වයෙන් යුතු බිම් කැබැල්ල සහ ඊට අයිති ගොඩනැගිලි සහ සෑම සියලුදේත් සමගය. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1434/231 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී දේපළට පහත සවිස්තරව දක්වා ඇති පාර සඳහා වෙන් කිරීම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමගය.

1. ඉහත කී හේවාගම ගමේ පිහිටි වැලිවිටවත්ත සහ උඩුවිලකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 2395 සහ 2003 අප්‍රේල් මස 20 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 96(පාර සඳහා වෙන් කිරීම) දරන බිම් කොටසට මායිම් උතුරට : ලොට් 91 ද, නැගෙනහිරට : ලොට් 67 සිට 62, 95 සහ 61 සිට 59 ද දකුණට : ලොට් 101 ද බස්නාහිරටඃ ලොට් 52 සිට 49, 97 සහ 44 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2395 දරන පිඹුර අනුව පර්චස් විසිඑකයි දශම අටයි දෙකක (අ. 0, රූ. 0, ප. 21.82) විශාලත්වයෙන් යුතු ඉඩම් කැබැල්ලය. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1530/55 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී හේවාගම ගමේ පිහිටි වැලිවිටවත්ත සහ උඩුවිලකුඹුර නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 2395 සහ 2003 අප්‍රේල් මස 20 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 91 (පාර සඳහා වෙන් කිරීම) දරන බිම් කොටසට මායිම් උතුරට : ලොට් 107, 22 සහ 108 සහ කලින් එච්. ඩී. යූ. ගුණසේකරගේ ඉඩම වූ වර්තමානයේ දී ගිනෑන්ස් වත්ත ද, නැගෙනහිරට : (ප්‍රා. ස) පාර ද, දකුණට : ලොට් 90, 83, 82, 92, 68, 94, 67, 96, 44, 98, 43, 100 සහ 23 ද බස්නාහිරටඃ ලොට් 23, 107, 22 සහ 108 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2395 දරන පිඹුර අනුව රූඩ් එකකුත් පර්චස් දහතුනයි දශම හයයි බින්දුවක (අ. 0, රූ. 1, ප. 13.60) විශාලත්වයෙන් යුතු ඉඩම් කැබැල්ලය. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1530/54 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

04-250

---

## නිවැරදි කිරීමයි

2009 මාර්තු මස 20 වැනි සිකුරාදා පළකරන ලද අංක 1594 දරන ගැසට් පත්‍රයේ I කොටස : I ඡේදය කොටසේ විවිධ දැන්වීම් යන ශීර්ෂය යටතේ පළවූ අංක 378/2 දරන දැන්වීමේ ශීර්ෂය ඩී. එෆ්. සී. සී. බැංකුව නමින් පළවිය. එම ශීර්ෂය ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුව යනුවෙන් නිවැරදි විය යුතුය.

එල්. ජී. පෙරේරා,
කළමණාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

2009 මාර්තු මස 31 වැනි දින,
ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 03.

04-360

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.